**නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 11 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**
**-------**

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**-----------------------**

**(අ)** සමාලෝචිත වර්ෂයේදී දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව සභාව වෙත ලබාදුන් ගැල්වනයිස් බට 696 ක වටිනාකම රු.770,571 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**(ආ)** ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් වී ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන වල උපලේඛනයෙහි ඇතුළත් නොවූ ඉඩම් වල වටිනාකම රු. 180,000 ක් විය.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**
**----------------------------------**

එකතුව රු.154,960,858 ක් වූ වත්කම්/ වගකීම්/ ආදායම් විෂයයන් 06 ක් සම්බන්ධයෙන් අයිතිය තහවුරු කිරීමේ ලියවිලි/ විස්තරාත්මක උපලේඛන ආදී ලියවිලි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**02 මූල්‍ය සමාලෝචනය.**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් ඌණතාවය රු.6,349,495 ක්වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ලැබ් තිබුණු මෙහෙයුම් ඌණතාවය රු.885,858 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 කඩකුලී**

**සමාලෝචිත වර්ෂය අවසාන වනවිට** හිඟ කඩකුලිය රු.148,700 ක් වූ අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 කසල ශෝධක ගාස්තු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (2) වගන්තිය අනුව දිර්ඝ කාලයක සිට ඉදිරියට එමින් පවතින රු.600,000 ක්වූ හිඟ කසල බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 උසාවි දඩ මුදල්**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ129 (2)(අ) වගන්තියේ දැක්වෙන පරිදි පලමුවන උප ලේඛනයේ සඳහන් ලිඛිත නීතිවල දැක්වෙන විධිවිධාන කඩ කිරීම සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් අය කරනු ලබන සියළු දඩ මුදල් හඳුනා ගෙන ප්‍රාදේශීය සභා අරමුදලට බැර කිරිමට කටයුතු කළයුතු වුවද හිඟ උසාවි රු.2,803,266 ක් සම්බන්ධව එපරිදි කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවන ගණුදෙනු

සමාලෝචිත වර්ෂයේදී විධිමත් අනුමැතියකින් තොරව විෂයයන් 14 කට අදාල එකතුව රු.4,861,930 ක්වූ ශේෂ ගිණුම්වලින් ඉවත් කර තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

**(අ)** දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සභාව වෙත සමාලෝචිත වර්ෂයේදී ලබාදුන් ගැල්වනයිස් බට 696 කින් වටිනාකම රු.515,928 ක්වූ ගැල්වනයිස් බට 466 අස්ථානගත වී තිබූ අතර ඒ පිළිබඳ විධිමත් පරීක්ෂණ ආරම්භ කර නොතිබුණි.

**(ආ)** 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.141,835,000 ක ලෙස දක්වා තිබුණද එම ඉඩම්වල අයිතිය පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 03 හි විධිවිධාන පරිදි සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ)** 1995 ඔක්තෝබර් 06 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ පලකර තිබුණු පරිදි සභා බල ප්‍රදේශය තුල පිහිටි සුසාන භූමි සම්බන්ධයෙන් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ 2006 නොවැම්බර් 14 දිනැති අංක PL/07/01/53 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛඅංක 9 හි යෝජනා හා නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**04. පද්ධති හා පාලනය**

**----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**(අ)** ගිණුම්කරණය.

**(ආ)** ආදායම් පරිපාලනය.

**(ඇ)** වත්කම් කළමනාකරණය